NDB bank
Our Commitment. Your Success.

නාමයෝජනා ආකෘති පත්‍රය

(ජංගම ගිණුම් සහ හවුල් ගිණුම් සඳහා වලංගු නොවේ)

කළමනාකරු,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,
(සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය. PQ 27)
අංක. 40, නවම් මාවත,
කොළඹ 02

දිනය: .....

හිතවත් මහත්මයාණනි/ මහත්මියනි,

ගිණුම් අංකය/ අංක/ ආරක්ෂිත තැන්පතු සේප්පු අංකය/ අංක

1. ..... (ගිණුම් හිමියාගේ/ ආරක්ෂිත තැන්පතු/ සේප්පු හිමියාගේ ලිපිනය) යන ස්ථානයේ පදිංචි ..... (ගිණුම් හිමියාගේ/ ආරක්ෂිත තන්පතු සේප්පු හිමියාගේ සම්පූර්ණ නම) වන මා විසින් බැංකුව සමග ඉහත සඳහන් ගිණුම/ ගිණුම්/ ආරක්ෂිත තැන්පතු සේප්පුව/ සේප්පු පවත්වාගෙන යන බවට මා විසින් මෙයින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

2. පහත දැක්වෙන කාර්ය සඳහා 1993 අංක. 14 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ 544(1) වන වගන්තිය ප්‍රකාරව පහත දැක්වෙන තැනැත්තන් නම් කිරීම මාගේ කැමැත්ත සහ අභිලාෂය වේ:-

නාමිකයාගේ සම්පූර්ණ නම	**නාමිකයාගේ පදිංචි ලිපිනය**	**සම්බන්ධකරගත හැකි දුරකථන අංකය**	**ජාතික හැඳුනුම්පත් අංකය**	**නාමිකයන්ට මාගේ ශේෂ මුදල්වලින් ලබා දිය යුතු අනුප්‍රමාණ % (ආරක්ෂිත තැන්පතු සේප්පු සඳහා අදාළ නොවේ)**
1				%
2				%
3				%
4				%

2.1 එනම් මාගේ මරණය සිදුවන අවස්ථාවක දී ආරක්ෂිත තැන්පතු සේප්පුවේ පවතින සියලු චංචල දේපළ සහ/ හෝ ඉහත කී ගිණුමේ/ ගිණුම්වල බැරට පවතින මුදල් ලබා ගැනීම සඳහා ඉහත සඳහන් නාමිකයන් පත් කර සිටින අතර මා විසින් මෙහි මින් පෙර හෝ මෙහි මින් මතු සකස් කරනු ලබන යම් අන්තිම කැමති පත්‍රයක හෝ තෙස්තමේන්තු ආකාරයේ යම් ලේඛනයක පටහැනිව කුමක් ප්‍රකාශයට පත් කර තිබුණ ද එම ප්‍රකාශ නොසලකා හරිමින් මාගේ මරණයෙන් පසුව මෙම නාමයෝජනාව ක්‍රියාත්මක විය යුතු බවත් මෙම නාමයෝජනාව ශ්‍රී ලංකාවේ නීතියට යටත් වන බවත් මම පිළිගෙන සිටිමි.

3. මෙම නාමයෝජනාව මගින් මා විසින් කලින් සිදු කරන ලද නාමයෝජනා ප්‍රත්‍යාදිෂ්ඨ වන අතර මෙම නාමයෝජනාව ඔබ වෙත ලිඛිතව භාර දෙනු ලබන නිවේදනයක් මගින් මා විසින් ප්‍රකාශිතව ප්‍රත්‍යාදිෂ්ඨ කරන තෙක් හෝ මා විසින් යථා පරිදි කරනු ලබන යම් පශ්චාත් නාමයෝජනාවක් මගින් මා විසින් ප්‍රකාශිතව ප්‍රත්‍යාදිෂ්ඨ කරන තෙක් මෙම නාමයෝජනාව බලාත්මකව පැවතිය යුතු වේ.

4. මාගේ මරණය සිදු වන දිනයේ දී ඉහත කී ගිණුමේ/ ගිණුම්වල පවතින ශේෂ මුදල් බැංකුව විසින් මෙහි සඳහන් නාමිකයා/ නාමිකයන් වෙත ගෙවීම, ඉහත කී පනතේ 544(5) වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එම ගිණුම/ ගිණුම් සම්බන්ධයෙන් වන බැංකුවේ වගකීම පූර්ණ වශයෙන් සහ සම්පූර්ණයෙන් නිදහස් වීමක් වන බවට මා විසින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

5. මාගේ ඉහත කී ආරක්ෂිත තැන්පතු සේප්පුව/ සේප්පු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, මාගේ මරණය සිදු වන දිනයේ දී එම සේප්පුවේ/ සේප්පුවල පවතින අයිතම සියලු නාමිකයන් ඉදිරිපිට දී අදාළ නාමිකයා වෙත හෝ සියලු නාමිකයන් වෙත භාර දෙනු ලැබිය යුතු බවත් එසේ භාර දීම, ඉහත කී පනතේ 544(5) වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එම අයිතම සම්බන්ධයෙන් වන බැංකුවේ වගකීම පූර්ණ වශයෙන් සහ සම්පූර්ණයෙන් නිදහස් වීමක් වන බවට මා විසින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

6. වෙනත් යම් ගිණුම්වල ශේෂය සහ වගකීම් එකම ව්‍යවහාර මුදලින් ප්‍රකාශිතව නොතිබුණ ද එය නොසලකා හරිමින් සහ එක් ගිණුමක් මත පවතින මාගේ ණයගැතිභාවය පිළිබඳ වගකීම සැබෑ හෝ අනිශ්චිත, මූලික හෝ සම්පාර්ශ්වීය සහ වෙන් වෙන්ව හෝ ඒකාබද්ධව තිබුණ ද එය නොසලකා හරිමින්, එක් ගිණුමක පවතින බැරකම් ශේෂය තවත් ගිණුමකට මාරු කිරීම මගින් බැංකුව කෙරෙහි පවතින මාගේ ණයගැතිභාවය මා වෙත/ මාගේ උරුමක්කරුවන් වෙත නිවේදනය කිරීමකින් තොරව ගෙවා නිරාකරණය කිරීම සඳහා ඔබට හිමිකමක් ඇත්තේ ය. මාගේ බංකොලොත්භාවය හෝ මරණය මගින් බැංකුවේ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවන්නේ ය.

නියම සහ කොන්දේසි

1. අදාළ නීතිවලට සහ බැංකුවේ හිලව් කිරීමේ සාමාන්‍ය අයිතියට යටත්ව, ගිණුම්හිමියාගේ/ ආරක්ෂිත තැන්පතු සේප්පු හිමියාගේ අන්තිම කැමති පත්‍රයක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොසලකා හරිමින්, මෙම නාමයෝජනාව ක්‍රියාත්මක විය යුතු ය.

2. පහත දැක්වෙන අවස්ථානුගත කරුණු යටතේ මෙම නාමයෝජනාව ප්‍රත්‍යාදිෂ්ඨව පවතින්නේ ය; එනම් -

   (අ) ගිණුම්හිමියා/ ආරක්ෂිත තැන්පතු සේප්පු හිමියා ජීවත්ව සිටින කාලය තුළ දී නාමිකයා හෝ නාමිකයන්ගෙන් එක් අයකු මිය යෑම;

   (ආ) ගිණුම්හිමියා/ ආරක්ෂිත තැන්පතු සේප්පු හිමියා විසින් ලිඛිත නිවේදනයක් මගින් නාමයෝජනාව ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම;

   (ඇ) ගිණුම්හිමියා/ ආරක්ෂිත තැන්පතු සේප්පු හිමියා විසින් යථා පරිදි පශ්චාත් නාමයෝජනාවක් සිදු කර එම නාමයෝජනාව බැංකුව වෙත භාර දීම.

3. මෙම නාමයෝජනාව ක්‍රියාත්මක කිරීමට නොහැකි වන අවස්ථාවක දී, නෛතික කාර්යපටිපාටිය අනුගමනය කිරීමෙන් පසුව නෛතික කාර්යපටිපාටිය අනුගමනය කිරීමෙන් පසුව නෛතික වශයෙන් හිමිකම් ඇති තැනැත්තා/ තැනැත්තන් වෙත මුදල්/ චංචල දේපළ ගෙවනු ලැබේ.

4. අනන්‍යතාව පිළිබඳ සාක්ෂියක් ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් නාමිකයා/ නාමිකයන් වෙත ගෙවීම් කරනු ලබන අතර එම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා බැංකුවට අවශ්‍ය විය හැකි යම් තොරතුරු/ ලේඛන ඉල්ලා සිටීම සඳහා බැංකුව වෙත අයිතිය රඳවා තබාගනු ලැබේ.

5. ආරක්ෂිත තැන්පතු සේප්පුවක් පිළිබඳ නාමයෝජනාවක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අනන්‍යතාවය පිළිබඳ සාක්ෂියක් ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක්, නාමිකයකු වෙත හෝ (නාමිකයන් එක් අයෙකුට වඩා වැඩි ප්‍රමාණයක් සිටී නම්) සියලු නාමිකයන් ඉදිරිපිට දී සියලු නාමිකයන් වෙත ආරක්ෂිත තැන්පතු සේප්පුවේ තැන්පත් කර ඇති චංචල දේපළ භාර දෙනු ලැබිය යුතු අතර එම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා බැංකුවට අවශ්‍ය විය හැකි යම් තොරතුරු/ ලේඛන ඉල්ලා සිටීම සඳහා බැංකුව වෙත අයිතිය රඳවා තබා ගනු ලැබේ.

.....
අත්සන

(.....)
ගිණුම් හිමියාගේ/ ආරක්ෂිත තැන්පතු සේප්පු හිමියාගේ සම්පූර්ණ නම

මෙම නාමයෝජනා පත්‍රයට සාක්ෂි වශයෙන්, අප විසින් වර්ෂ දෙදහස් ..... වූ ..... මස ..... දින ..... යන ස්ථානයේ දී මෙම ලේඛනයටත් මෙයට සමාන තවත් එක් ලේඛනයකටත් අත්සන් තබා සහතික කරන ලදී.

සාක්ෂිකරුවන්

	සම්පූර්ණ නම	**පුද්ගලික ලිපිනය**	**තනතුර/ රැකියාව**	**අත්සන**	**ජා.හැ.පත් / EPF අංකය**
1					
2					

නාමයෝජනා ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

(1) තනිපුද්ගල ගිණුම් සම්බන්ධයෙන් පමණක් බැංකුව විසින් නාමයෝජනා භාරගනු ලැබේ.

(2) ජංගම ගිණුම් සඳහා සහ හවුල් ගිණුම් සඳහා නාමයෝජනා ඉදිරිපත් කරනු ලැබිය නොහැකි වේ.

(3) තනිපුද්ගලයන්ගේ ආරක්ෂිත තැන්පතු සේප්පු සම්බන්ධයෙන් නාමයෝජනා භාරගනු ලබන නමුත් නාමිකයන් එක් අයෙකුට වඩා වැඩි දෙනකු සිටින අවස්ථාවක දී ප්‍රතිශත පදනමක් මත නාමිකයන් වෙත ආරක්ෂිත තැන්පතු සේප්පුවල පවතින අයිතම භාරදෙන ලෙස කරනු ලබන උපදෙස් බැංකුව විසින් පිළිගෙන නොසිටියි.

(4) ගිණුම්හිමියාගේ අත්සන සාක්ෂි දෙකක් මගින් තහවුරු කළ යුතු අතර එම අත්සන්කරුවන්ගෙන් එක් අයකු බැංකු ශාඛා කළමණාකරු/ සහකාර ශාඛා කළමණාකරු/ ප්‍රාදේශීය කළමනාකරු විය යුතු ය.

මෙම කාර්ය සඳහා, යම් 03 වන පාර්ශ්වයක් විසින් සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් කරන්නේ නම්, ඔහු/ ඇය ගනුදෙනුකරු ද සමග (නාමිකයා) බැංකු ශාඛාව වෙත පැමිණ සිටිය යුතු වේ.

(5) නාමයෝජනා පත්‍රය ස්ථර දෙකකින් කාබන් කර සකසා ඇත.

(6) ගිණුම්හිමියා සහ සාක්ෂිකරු විසින් මුල් පිටපත සහ දෙවන පිටපත යන පිටපත් දෙකම අත්සන් කරනු ලැබිය යුතු ය.

(7) මුල් පිටපත ගිණුම් විවෘත කිරීමේ මැන්ඩේට් පත්‍රය/ ආරක්ෂිත තැන්පතු සේප්පු මැන්ඩේට් පත්‍රය සමග තැබිය යුතු වේ.

(8) පිටපත ගිණුම් හිමියා/ ආරක්ෂිත තැන්පතු සේප්පු හිමියා වෙත ලබා දිය යුතු වේ.